# තිරසර සංචාරක අංශ සංවර්ධන ව්‍යාපෘතිය

# ඇබෑර්තු නිවේදනය

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා රජය වෙත තිරසර සංචාරක අංශ සංවර්ධන ව්‍යාපෘතිය (STSDP) සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් (ADB) ඇමරිකානු ඩොලර් මිලියන 30 ක මුදලක් ලැබී ඇත. මෙම අරමුදල් දඹුල්ල (සීගිරිය) සහ ත්‍රිකුණාමලය යන ප්‍රමුඛතම සංචාරක නගර දෙකෙහි සංචාරක පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා යොදා ගැනීමට නියමිත වේ.

මෙම ව්‍යාපෘතිය ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලැබේ.

තිරසර සංචාරක අංශ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඇති පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා සුදුසුකම්ලත් සහ පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | ව්‍යාපෘතියෙහි නම | තනතුරු සංඛ්‍යාව | MSD චක්‍රලේඛ 01/2026 පරිදි වැටුප් කාණ්ඩය |
|---|---|---|---|---|
| 1 | ව්‍යාපෘති අධ්‍යක්ෂ | තිරසර සංචාරක අංශ සංවර්ධන ව්‍යාපෘතිය - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සේවා ස්ථානය - කොළඹ | 1 | A |
| 2 | අතිරේක ව්‍යාපෘති අධ්‍යක්ෂ | | 1 | B |
| 3 | පරිසර සහ සමාජ ආරක්ෂණ විශේෂඥ | | 1 | C |
| 4 | ජ්‍යෙෂ්ඨ ප්‍රමාන සමීක්ෂක | | 1 | C |
| 5 | ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී | | 1 | E |
| 6 | ජ්‍යෙෂ්ඨ ප්‍රසම්පාදන නිලධාරී | | 1 | E |
| 7 | තාක්ෂණ නිලධාරී | | 1 | F |
| 8 | ව්‍යාපෘති නිලධාරී (ආරක්ෂණ) | | 1 | F |
| 9 | ව්‍යාපෘති නිලධාරී (අධීක්ෂණ) | | 1 | F |
| 10 | ව්‍යාපෘති නිලධාරී (සංරක්ෂණ) | | 1 | F |
| 11 | කාර්යාල සහකාර | | 1 | සහායක කාර්ය මණ්ඩලය |
| 12 | රියදුරු | | 2 | |
| 13 | ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති ඉංජිනේරු | තිරසාර සංචාරක අංශ සංවර්ධන ව්‍යාපෘතිය : ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය - දඹුල්ල (PIU-D) සේවා ස්ථානය - දඹුල්ල | 1 | C |
| 14 | ජ්‍යෙෂ්ඨ ආරක්ෂණ නිලධාරී (සමාජ සහ ස්ත්‍රී - පුරුෂ සමාජභාවය) | | 1 | E |
| 15 | ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී | | 2 | E |
| 16 | ව්‍යාපෘති නිලධාරී (පරිපාලන/ සම්බන්ධීකරණ) | | 1 | F |
| 17 | කළමනාකරණ සහකාර | | 1 | සහායක කාර්ය මණ්ඩලය |
| 18 | කාර්යාල සහකාර | | 1 | |
| 19 | ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති ඉංජිනේරු | තිරසාර සංචාරක අංශ සංවර්ධන ව්‍යාපෘතිය : ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය - ත්‍රිකුණාමලය (PIU-T) සේවා ස්ථානය - ත්‍රිකුණාමලය | 1 | C |
| 20 | ජ්‍යෙෂ්ඨ ආරක්ෂණ නිලධාරී (සමාජ සහ ස්ත්‍රී - පුරුෂ සමාජභාවය) | | 1 | E |
| 21 | ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී | | 2 | E |
| 22 | ව්‍යාපෘති නිලධාරී (පරිපාලන/ සම්බන්ධීකරණ) | | 1 | F |
| 23 | කළමනාකරණ සහකාර | | 2 | සහායක කාර්ය මණ්ඩලය |
| 24 | කාර්යාල සහකාර | | 1 | |

වැටුප් කාණ්ඩයන්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2026 පරිදි වේ.

**නියමයන් සහ කොන්දේසි**

- වේතන, නියමයන් සහ කොන්දේසි, 2026.02.02 දිනැති අංක 01/2026 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට සහ කලින් කලට සිදු කරනු ලබන එහි සංශෝධනයන්ට අනුකූලව වේ.
- මෙම පත්වීම වසරක කාල සීමාවක් සඳහා කොන්ත්‍රාත් පදනම මත සිදු කෙරෙන අතර, සතුටුදායක සේවා කාර්ය සාධනය මත පදනම්ව ව්‍යාපෘතිය කාලසීමාව දක්වා දීර්ඝ කළ හැකිය.
- විදේශ අරමුදල් ලබන ව්‍යාපෘති සහ සංචාරක ව්‍යාපාරය සම්බන්ධ ව්‍යාපෘති හි පළපුරුද්ද අමතර වාසියක් වේ.

**අයදුම්පත් ඉදිරිපත් කිරීම :**

- විස්තරාත්මක නිවේදනය සහ නිර්දේශිත අයදුම්පත් ආකෘතිය ලබා ගැනීම සඳහා **www.transport.gov.lk** වෙබ් අඩවිය පරිශීලනය කරන ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.
- යථා පරිදි සම්පූර්ණ කරන ලද, අයදුම්පත්, ජීවදත්ත පත්‍රිකාව (CV) අදාළ සහතික පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ (02) සම්බන්ධතා විස්තර සමග ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත් 2026 මාර්තු 01 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය.

**අතිරේක ලේකම් (ව්‍යාපෘති),**
**ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය,**
**06 වන මහල, සෙත්සිරිපාය - අදියර II, බත්තරමුල්ල.**

**වැදගත්**

- අයදුම්කරනු ලබන තනතුර, කවරයෙහි ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.
- රාජ්‍ය අංශයේ අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හරහා ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.
- අසම්පූර්ණ හෝ අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- කෙටිලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

**ලේකම්,**
**ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය.**